# කිතුනු සභා ඉතිහාසයේ පැතිකඩක්

විජිත් රොහාන් ප්‍රනාන්දු

This article on the History of the Christian Church urges the readers to critically examine the historical development of the Church while focusing on its scripturally - rooted mission for God's Kingdom. The *EKKLESIA* or the Church has to be a sign of God's Kingdom while being a counter sign of the Empire, the Kingdom of the secular rulers. The Crusades, the Inquisitions and the Lutheran Reformation are analysed here as the consequences of Churches' reliance on secular powers. However, the renewal of the Church introduced by the Second Vatican Council (1962-1965) is considered the first Council in history to define the Church non-hierarchically as the "People of God" urging the Church to be an *EKKLESIA*.

කිතුනු සභා ඉතිහාසය නිවැරදිව හඳුනා ගැනීමට පසුබිමක් ලෙස ශුද්ධ වූ සංඝයේ බයිබලීය පදනම කුමක් ද යන්න පළමුව විමසා බලමු. මෙහි දී කිතුනු සංඝය පිළිබඳ නිර්වචන දෙකක් සසඳා බැලීම වැදගත් වේ.

## අ) රොබට් බෙලාමින්ගේ නිර්වචනය

"[...] සත්‍ය විශ්වාසය ප්‍රකාශ කිරිමෙන් ද, ප්‍රසාද නිධාන ලබා ගැනිමෙන් ද, පිළිගත් නායකයන්, විශේෂයෙන් මිහිපිට ක්‍රිස්තුන් වහන්සේගේ තැන ගන්නා **ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයාණන්** (ස්ථානග්‍රාහකයාණන්) (Vicar of Christ) හෙවත් **රෝමානු නායක පූජකයාණන්ගේ (මැදහත්කරුවාණන් - Mediator) (Roman Pontiff)**ගේ පරිපාලනය යටතේ එක් කරනු ලැබූ පොදු හවුලය."[1]

---

© විජිත් රොහාන් ප්‍රනාන්දු

සංස්. ආචාර්ය පූජ්‍ය මීමුරේ ගුණානන්ද හිමි, මහාචාර්ය ඊශා හේවාබෝවල, මහාචාර්ය සුසන්ත මහඋල්පත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක
මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 19 කලාපය, 2012/13, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**ආ) රිචඩ් මැක්බ්‍රයන්ගේ නිර්වචනය**

> "[...]තම පුත්‍ර **ජේසුස්ගේ ස්වාමිත්වයට** වචනයෙන්, සක්‍රමේන්තුවෙන්, සාක්ෂි දැරීමෙන් සහ සේවය කිරීමෙන් පිළිගැනීමට ද, පුත්‍රයාණන් වහන්සේගේ බලයෙන් **දේව රාජ්‍ය** උදෙසා ජේසු සමිඳුන්ගේ ඓතිහාසික දූත මෙහෙවරට සහයෝගීව සේවය කිරීමට ද, දෙවිඳුන් විසින් කැඳවනු ලැබූ **සියලු ජනතා සමූහය** යි."[2]

කිතුනු සංඝය පිළිබඳ මෙම නිර්වචන දෙක සසඳා බැලීමෙන් දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට (1962-1965) පෙර රෝම කිතුනු සභාවේ පැවති සභාවේදය හෙවත් ප්‍රව්‍රජ්‍යාවේදය (Ecclesiology) පිළිබඳ දැක්ම අපට අවබෝධ කර ගත හැකිය.

**නිර්වචන සැසඳීමක්**

රොබට් බෙලාමින් යනු ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාවෙන් (1545-1563) පසුව විසූ ජේසු නිකායේ කාදිනල්වරයෙක් මෙන්ම රෝමයේ දේවධර්මය උගන්වමින් රෝම සභාව සුරකීමට වාද විවාද කළ අයෙකි. ඔහුගේ නිර්වචනයට අනුව ශුද්ධ වූ සංඝය රෝම සභාවට පමණක් සීමා වෙයි. එහෙත් යථාර්ථය නම් කිතුනු සභා ඉතිහාසයේ මුල් යුගයේ සිටම ශුද්ධ වූ සංඝය ප්‍රධාන සභා පහකින් සමන්විත ව තිබීමයි. එම කිතුනු සභාවන් ශ්‍රේෂ්ඨ අගරදගුරුවසම් හෙවත් පීතෘ සභා පහක් (The Five Patriarchates in the Roman Empire) වශයෙන් මෙසේ දැක්විය හැකිය. රෝමය (රෝම අධිරාජ්‍යයේ බටහිර) කොන්ස්තන්තිනෝපලය, ඇලෙක්සැන්ඩ්‍රියාව, ජෙරුසලම සහ අන්තියෝකය (රෝම අධිරාජ්‍යයේ නැගෙනහිර)[3]

තවද රොබට් බෙලාමින් රෝම සභාවේ නායක පාප්තුමාව හඳුන්වා ඇත්තේ මිහිපිට ක්‍රිස්තුන් වහන්සේගේ තැන ගන්නා **ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයාණන් (Vicar of Christ)** ලෙසය. මෙය ගෙලාසියුස් පාප් යුගයේ දී (Pope Gelasius - 492-496) ලැබූ නිල නාමයකි. රෝමයේ පැවති රදගුරු සමුළුවකින් හෙවත් සිනොඩයකින් (495) පාප්තුමා ලද පදවි නාමයකි. ගෙලාසියුස් යටතේ පාප්වරයට ආධ්‍යාත්මික (spiritual) මෙන් ම ලෝකායත්ත (secular) ලෙස පාලන බල දෙකක් හිමි විය. ඔහු විසින් ඇනස්ටාසියුස් අධිරාජ්‍යයාට

(Emperor Anastasius) යැවූ ලිපියකින් මෙම කරුණ සනාථ වේ."Two there are, august emperor, by which the world is chiefly ruled, the sacred authority (*auctoritas*) of the priesthood and the royal power (*potestas*)."[4]එහෙත් ශුභාරංචි මූලාශ්‍රයන්ට අනුව පාප්තුමා **ක්‍රිස්තුන් වහන්සේගේ නියොජිතයාණන්** යන නිල නාමය ගැනීම අනුචිතය. ඓතිහාසික ජේසු තුමන්ට අනුව පාප්තුමා ශ්‍රාවකයන් දොළොස් දෙනාගේ නායකයා වූ **පේදුරුගේ නියෝජිතයාණන්** (***Vicarius Petri***)ය. ශුද්ධවූ ලියවිල්ලට (මතෙව් 25: 31-46) අනුව **ක්‍රිස්තුන් වහන්සේගේ මිහිපිට නියෝජිතයාණන් (Vicar of Christ**) වන්නේ රෝම සභාවේ **නායක පූජකයාණන්** හෙවත් **මැදහත්කරුවාණන් (Roman Pontiff)** වන පාප්තුමා නොව දිළිඳු පීඩිත ජනතාවය.[5] තව ද මුල් සභා ඉගැන්වීමට අනුව පාප්තුමා යනු **පේදුරු හා පාවුලුගේ මිහිපිට නියෝජිතයා** (***Vicarius Petri et Pauli***) මිස **අපෝස්තුළුවරුන්ගේ අනුප්‍රාප්තිකයා** නොවන්නේ (not **successor**) ය. ඊට හේතුව නම් අපෝස්තුළුවරුන් දොළොස නම් වූ සීමාව ඉක්මවා ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් ලෙස කිසිවෙකු පත් කළ නොහැකි නිසාය.[6]

රොබට් බෙලාමින්ගේ නිර්වචනය පිළිබඳ තව දුරටත් විචාරාත්මකව විමසන විට පෙනී යන කරුණු කීපයකි. එනම් දෙවි පියාණන් හෝ ප්‍රාණයාණන් ගැන එහි සඳහන් නො වීමය. එමෙන්ම කිතුතුමා ගැන සඳහන් වන්නේ පාප්වරයාට මුල් තැන දීමටය. වෙනත් කිතුනුවන් සංඝයෙන් බැහැර කොට තිබීම. සංඝය ආගමික ආයතනයක් වූවද එහි නෛතික බව ඉස්මතු වීම. සංඝය තමන් වෙනුවෙන්ම පවතින ස්ථිතික සංවිධානයක් ලෙස ඔහු දැකීම.

රිචඩ් මැක්බ්‍රයන් යනු අමෙරිකා එක්සත් ජනපදයේ ඉන්දියානා ප්‍රාන්තයේ නූතන දේවධර්මාචාර්යවරයෙකි. සංඝයේ ස්වභාවය ගැන බයිබලීය පදනමක් ඔහුගේ නිර්වචනයෙන් දක්වෙයි. සංඝය යනු ජේසුතුමන් දේශනා කළ දේවරාජ්‍යයේ දූත සේවය උදෙසා කැඳවනු ලැබූ ජනතාවගේ සභාවකි. එම නිසා එය ගතික යථාර්ථයකි. සියලු කිතුනුවන් එයට අයත්ය. සංඝයේ ත්‍රිත්වික බව මෙම නිර්වචනයේ කැපී පෙනෙයි. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ශුද්ධ වූ සංඝය පිළිබඳ වන ව්‍යවස්ථාවේ (**ජාතීන්ගේ ආලෝකය** හෙවත් ***Lumen***

***Gentium***) මෙම ත්‍රිත්වික ලක්ෂණය විස්තර කරන්නේ සාන්ත සිප්‍රියන්තුමාගේ කියමනක් උපුටා දක්වමින්ය. "පිය, පුත්, සුදත්, වහන්සේලාගේ එකාබද්ධතාව තුළ එක් කරනු ලැබූ ජනතාවකි."[7]

ශුද්ධ වූ සංසයේ සැබෑ ස්වභාවය අපට තීරණය කළ හැකි වන්නේ බයිබලීය පදනම මතය. උක්ත නිර්වචන දෙක සැසඳීමෙන් වඩා නිවැරදි බයිබලීය නිර්වචනය අපට අවබෝධ කර ගත හැකිය. නව ගිවිසුමට අනුව ශුද්ධ වූ සංසය යනු කුමක් ද යන්න මෙතැන් සිට විමසා බලමු.

**නව ගිවිසුමට අනුව සංසය**

නව ගිවිසුමට අනුව සංසය යනු ප්‍රාණයාණන්ගේ බලයෙන් ක්‍රිස්තුන් වහන්සේ හිස වන ශරීරය වෙමින් එකමුතුකමින් අන්‍යොන්‍ය ලෙස බැඳුණු ජනතාවයි. එම ජනතාව **එක්ලේසියා** (**EKKLESIA**) යනුවෙන් හැඳින්වේ.[8] මෙහි දී **එක්ලේසියා** යන ග්‍රීක වචනයේ අර්ථය විමසා බැලීම වැදගත් වේ. **EK – එක්** යන උපසර්ගයෙන් දක්වෙන්නේ **පිටතට** යන අරුතයි. **KLESIA – ක්ලේසියා**යන වචනයේ අර්ථය වන්නේ **කැඳවනු ලැබූ** යන්නයි. **පිටතට කැඳවීම** යන අරුත දෙන හීබෲ වචනය නම් **කාආල් (QAHAL)**ය. (ද්විතීය නීති සංග්‍රහය 9:10,10:4).

**සිනගෝගය** යනු ජුදා ආගමික ජන සමූහය එක් රැස්වූ ස්ථානයයි. නමුත් මුල් කිතුනුවන් වූ ජුදෙව්වරු තම සංසයේ රැස්වීම් සඳහා භාවිත කළ නම වූයේ '**එක්ලේසියා**' යන්නයි. මේ අනුව **එක්ලේසියා** යනු නව ගිවිසුමට සුවිශේෂ වූ වචනයකි. **එක්ලේසියා** යන වචනය පාවුලුතුමාගේ ලිපිවල 46 වතාවක් සඳහන් වේ. පළමු කොරින්ති ලිපියේ 22 වතාවක්, එළිදරව් පොතේ 20 වතාවක්, ක්‍රියා පොතේ 23 වතාවක්, මතෙව් ශුභාරංචියේ 02 වතාවක් (16:8 සහ 18:17) දක්නට ලැබේ. ජේසුගේ මරණය හා උත්ථානයෙන් පසුව ආරම්භවූ කිතුනු සංසවලට පමණක් මෙම වචනය භාවිත වීම විශේෂත්වයකි.[9]

**අධිරාජ්‍යයෙන් පිටතට**

**එක්ලේසියා** යනු පිටතට කැඳවනු ලැබීම වන අතර බයිබලීය මූලාශ්‍රවලට අනුව දෙවියන් වහන්සේ තම ජනතාව කැඳවනු

ලබන්නේ කුමකින් පිටතට ද? යාහ්වේ දෙවිඳාණෝ තම ජනතාව කැඳවනු ලැබුවේ **අධිරාජ්‍යයෙන් පිටත තිබිය යුතු සේවකත්වයේ සභාවකට ය.**

ක්‍රි. පූ. 3000 පෙර පැවති සුමේ හෙවත් දකුණු මෙසපොතේමියාවේ පාලනය ක්‍රමයෙන් පිරිහීමට ලක් වූ පසු මධ්‍යම මෙසපොතේමියාවට පාලනය හිමි වූ අතර එහි වාසය කළ ආකේඩියන්වරු අධිරාජ්‍යයක් පවත්වාගෙන යාමේ ආදර්ශය ලෝකයට ලබා දුන්නෝය. **යාහ්වේ** දෙවිදාණෝ මෙම අධිරාජ්‍යයෙන් පිටතට ආබ්‍රහම් ව කැඳවූයේත් (උත් 12:1 සිට) මෝසෙස්ගේ නායකත්වයෙන් මිසර අධිරාජ්‍යයේ පාරාවෝ රජු යටතේ වහල් වූ ඊශ්‍රායෙල් ජනතාව ඉන් මුදාගෙන කානාන් හෙවත් පොරොන්දු දේශය වෙත කැඳවූයෙත් (නික්මයාම 6:2-13 සහ ජෝෂුවා 24:2-28) අධිරාජ්‍යයෙන් පිටත තිබිය යුතු සේවකත්වයේ සභාවක් දේව රාජ්‍යයේ සංකේතයක් ලෙස මෙම ලෝකය තුළ ගොඩනැගීමටය**.** අධිරාජ්‍යයේ ව්‍යුහය සහ රාජ්‍ය පාලන සැලැස්ම සැදී ඇත්තේ උස් පහත් භේදය නිත්‍යානුකූලව පිළිගන්නා ධූරාවලියකින් යුක්තවය. එනම් රජ, රාජ්‍යය සේවකයන්, හමුදාව හා පූජකවරුන්ගෙන් සැදුම් ලත් රාජ්‍ය පාලනයකට අනුකූලවය. මුල් ගිවිසුමේ **වීරාවලිය** නම් වූ පොතේ දක්වෙන පරිදි සම්සොන් වැනි වීරයන් උත්සාහ කළේ පීඩක අධිරාජ්‍යයන්ගෙන් පිටතට කැඳවනු ලැබූ පීඩිත ජනතාවගේ **විකල්ප නව සමාජය** මධ්‍යධරණී මුහුදු තීරයේ සැතපුම් 150ක පමණ වෙරළ තීරයක දේව රාජ්‍යයේ පරමාදර්ශය ලෙස ගොඩනැගීමටය. එහෙත් එලෙස ගොඩනගන ලද සේවක නායකත්වය නැවත අධිරාජ්‍යයේ ධූරාවලියට යටත්ව අධිරාජ්‍යය වෙතම සේන්දු වූ කතා පුවත මෙහෙහි කිරීමට අපට හැකි වන්නේ ඊශ්‍රායෙල් ජනතාව **යාහ්වේ** දෙවිඳුන්ගේ රජකම (නික්මයාම 15:18) ප්‍රතික්ෂේප කොට ලෞකික රජවරුන් පත්කර ගැනීම (1 සාමුවෙල් 8:16-22) සහ බබිලෝනිය විප්‍රවාසය (ගීතාවලිය 137) කියවීමෙන්ය.

නව ගිවිසුමේ සමාජ-දේශපාලනික පසුබිම විමසූ කළ පලස්තීනය රෝම අධිරාජ්‍ය යටතේ පැවති බව අප අමතක නොකළ යුතුය. තව ද රෝම අධිරාජ්‍යයේ ධූරාවලිය හේතු කොට ගෙන පීඩක සුළුතරයක් හා පීඩිත බහුතරයකින් යුත් විෂම සමාජ ක්‍රමයක් සැදී තිබීම

නාසරතයේ ජේසුතුමන් දේශනා කළ කිතුනු සංසය කුමක් ද යන්න නිවරදිව වටහා ගැනීමට වැදගත් වේ. ජේසුතුමන් දේව රාජ්‍ය මිහි මත ඇති කිරීම සඳහා අධිරාජ්‍යයේ ධූරාවලියට වෙනස් කිතුනු සංසයක් අපේක්ෂා කළේය. එය බල අධිකාරිත්වයේ හෝ ආධිපත්‍යයේ සභාවක් නොව සේවකත්වයේ සභාවකි. (මාක් 10:42-45, ලූක් 14:7-14). අධිරාජ්‍යයේ ජීවත් වුව ද එයට අයිති නොවන ඉන් පිටතට ජනතාව කැඳවන (එක්ලේසියා) ජේසුතුමා ගැන මතෙව් 6:28-29 සහ 6:33 ශුභාරංචි පාඨ මගින් අපට මෙනෙහි කළ හැකිය.

බබිලෝනිය හෙවත් රෝම අධිරාජ්‍යයෙන් පිටතට මුල් කිතුනු සංසය කැඳවන ආකාරය අපට එළිදරව්ව පොතේ 18 පරිච්ඡේදයෙන් වඩාත් අවබෝධ වේ. පොළොවේ රජවරු (9-10), මුල් කිතුනු සංසය විසින් අධිරාජ්‍යයේ වෙළඳ භාණ්ඩ මිලට නොගන්නා බැවින් හඬා ශෝක වන දේශාන්තර වෙළෙන්දන් (11) හා අධිරාජ්‍යයේ ආර්ථික භාණ්ඩවලට ඇතුළත් වන වහලුන් සහ මිනිස් ජීවිත (12-13) මීට නිදසුන්ය.

රෝම අධිරාජ්‍යයේ විසූ මුල් කිතුනු සංසය තමන්ව අධිරාජ්‍යයෙන් පිටතට කැඳවනු ලැබූ ජනතාවක්ය යන ක්‍රිස්තියානි අනන්‍යතාව තම ජිවිත ප්‍රතිපදාව මගින් පෙන්වූ ආකරය රෝම අධිරාජ්‍යයේ සිටි අන්‍යාගමික පුරවැසියෙකුගේ ලිපියකින් සාක්ෂාත් වේ. "සේසරුගේ දිනයේ ඔවුන් තම නිවෙස්වල දොර ජනේල සැරසුවේ නැත. ඔවුන්ගේ ඇඳුම් හා ආහාර ඉතා සරල විය. ඔවුන් මස් මාංස කෑවද ඒ සඳහා ජීවත් වූයේ නැත. ඔවුන්ට පොදු භෝජන මේසයක් තිබුණද පොදු ඇඳක් තිබුණේ නැත. රෝම විශුකදර්ශන ඔවුන් නැරඹුවේ නැත. අන් අය මෙන් ඔවුන් විවාහ වී දරුවන් මෙලොවට බිහි කළ ද එම දරුවන් සදාචාර විරෝධී ක්‍රියාවලට යොමු කළේ නැත. මේ ලෝකයේ ජීවිත ගත කළ ද ඔවුහු ස්වර්ගයේ පුරවැසියෝ වූහ."[10]

මේ අනුව එක්ලේසියා නම් වූ මුල් කිතුනුවන්ගේ සංසය කුමක් ද? ජේසු සමිඳුන්ගේ ප්‍රාණය විසින් අධිරාජ්‍යයෙන් පිටතට කැඳවනු ලැබූ ජනතාවකි. ඔවුහු කැඳවීම ලැබුවේ කුමකට ද? දේව රාජ්‍යයේ දූත මෙහෙවර උදෙසාය. දේවධර්මාචාර්ය එඩ්වඩ් ස්කිලබෙක්ස්ට (Edward Schillebeeckx) අනුව දේව රාජ්‍යය යනු "ස්ත්‍රී පුරුෂයන්

මැද, ඔවුන් ඉඩදෙන පරිදි ක්‍රියාකාරී වන, ඔවුන් දිරිගන්වන දෙවිඳුන්ගේ ගැලවීමදායක වැඩසිටීම යි. ස්ත්‍රී පුරුෂයන් විසින් නිදහසේ පිළිගනු ලබන, සියල්ලට ම වඩා පුද්ගලයන් හා ජනකොටස් අතර සාධාරණ, සාමකාමී සම්බන්ධතා ගොඩනංවන, රෝගාබාධ, අසාධාරණත්වය, පීඩනය දුරු කරන, මියගිය සහ මියැදෙන සැමට ජීවනය උදාකර දෙන දෙවිඳුන් විසින් පිළිගන්වනු ලැබ, ස්ත්‍රී පුරුෂයන් විසින් පිළිගනු ලබන දෙවිඳුන්ගේ වැඩසිටීම යි. දේව රාජ්‍ය යනු මනුෂ්‍යයන්ගේ චිත්තාවර්තනය මගින්, ඔවුන් සහ දෙවිඳුන් අතර පවතින නව සම්බන්ධතාවකි. එහි ප්‍රත්‍යක්ෂ සහ දෘශ්‍යමාන පැතිකඩය වනුයේ, සාමකාමී ස්වාභාවික පරිසරයක, සමාජය තුළ ස්ත්‍රී පුරුෂයන් අතරත් නව ආකාරයක විමුක්තිදායක සම්බන්ධතා ඇතිවීම යි. (*The Church: The Human Story of God*, 111-112)"[11]

**නැවත අධිරාජ්‍යය ඇතුළට**

ජේසු සමිඳුන්ගේ ප්‍රාණය විසින් අධිරාජ්‍යයෙන් පිටතට කැඳවනු ලැබූ මුල් කිතුනු සංඝය හෙවත් **එක්ලේසියාව** නැවත අධිරාජ්‍යය වෙත සෙන්දු වූයේ රෝම අධිරාජ්‍යයා වූ කොන්ස්ටන්ටයින් විසින් මෙතෙක් පැවති පීඩනය නවතා ක්‍රිස්තියානි ආගමට මෙන්ම කිතුනු නොවන අන් ආගම්වලට නිදහස ලබා දීමෙන් පසුවය. එය සිදුවූයේ වර්ෂ 313 මිලාන් නියෝගය මගින්ය.[12]

ක්‍රිස්තියානිය රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම ලෙස නීතිගත කළේ වර්ෂ 386 දී තියඩෝසියුස් අධිරාජයා (379-95) විසින් ය. දෙවන තියඩෝසියුස් අධිරාජයා (408-50) විසින් ක්‍රිස්තියානියට විශේෂ තැනක් ලබා දෙමින් අන් සියලුම ආගම් මිථ්‍යාදෘෂ්ටික ඒවා ලෙස සලකා තහනම් කරනු ලැබුවේ තියොඩෝසියුස්ගේ නීති සංහිතාව (Theodosian Code) මගින්ය.[13]

නැවත අධිරාජ්‍යය ඇතුළට සේන්දු වීම හේතු කොට ගෙන කිතුනු සංඝයේ සේවකත්වයේ ස්වභාවය වෙනස් වී එය බල අධිකාරිත්වයේ ආයතනයක් බවට පත් විය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ රෝම අධිරාජ්‍යය ක්‍රිස්තියානි වීම සහ ක්‍රිස්තියානි සංඝය රෝමානු වීමය.[14]

**ප්‍රතිවිපාක**

නාසරතයේ ජේසුතුමන් අපේක්ෂා කළ අධිරාජ්‍යයෙන් පිටතට පැමිණිය යුතු කිතුනු සංඝය හෙවත් **එක්ලේසියාව** අධිරාජ්‍යයේම අනුරුවක් බවට පත් වූ ආකාරය **පාප් වරයේ ඉතිහාසය** පිළිබඳ අධ්‍යයනයේ යෙදෙන විට මැනවින් පැහැදිලි වේ.

දූර්මතයන්ට විරුද්ධව ලියොන්හි ඉරනේයුස් (Irenaeus of Lyons – 130-200) විසින් ගෙනහැර දැක්වූ රෝම සභාවේ ප්‍රථමතාව (Primacy of Rome)[15] යන බල අධිකාරී මතය ඉස්මතු වීමත් සමඟම ශුද්ධ වූ සංඝයේ ඒකාත්මික බව හෙවත් එකම සංඝයක් යන ජේසුතුමන්ගේ අපේක්ෂාව නිල වශයෙන් බිඳ වැටුනේ වර්ෂ 1054 දී සිදුවූ නැගෙනහිර හා බටහිර සභා භේදය හේතු කොට ගෙනය.[16]

**කුරුස යුද්ධ**

මුස්ලිම් ආක්‍රමණ මැඩලීම සඳහා දෙවන උර්බන් පාප්තුමා විසින් (1088-1099) ආරම්භ කළ කුරුස යුද්ධ පසු කාලීනව තම මුල් අරමුණින් ඉවත පැන නැගෙනහිර බයිසන්තියම අධිරාජ්‍යය ආක්‍රමණය කිරීම,[17] ජුදෙව් ජනතාවට හිංසා පීඩා කිරීම පමණක් නොව ළමයින් පවා ඊට සහභාගි කර ගැනීමෙන් රෝම සභාවේ රාජකීය තේජස සහ තමන් ජයග්‍රාහී සභාවක් (Triumphalism) යන අධිරාජ්‍යයේ අනුරුවක් බවට පත් වීමේ ප්‍රතිවිපාකයන්ය.[18]

**(අධර්ම) ධර්මාධිකරණය**

දොළොස්වන සියවසේ දී රදගුරුවරුන්ගේ (අධර්ම) ධර්මාධිකරණයත් දහතුන්වන සියවසේ දී පාප්වර (අධර්ම) ධර්මාධිකරණයත් ස්ථාපිත කිරීමෙන් පසු පාප්වරයේ ලෝකායත බල වර්ධනය උච්චතම අවස්ථාවට පැමිණියේය.[19] මෙම ධර්මාධිකරණ මගින් දූර්මතධාරීන් ලෙස විනිශ්චයට ලක් කරමින් පුළුස්සා මරා මර්දනයට ලක් කළ පුද්ගලයන් වූයේ, නැවත අධිරාජ්‍ය වෙත සේන්දු වූ ශුද්ධ වූ සංඝය ඉන් පිටතට කැඳවීම සඳහා දිවැසිවරුන් මෙන් ක්‍රියා කළ කතාරිස්වරු, වල්ඩෙන්සියන්වරු,[20] ධර්මාධිකරණ පූජක විනිසුරුවන් විසින් මායාකාරීන් සේ සැලකූ විද්වත්, විචාරශීලී කාන්තාවන්,[21] ලූතරානු ප්‍රතිසංස්කරණයේ පෙර ගමන්කරුවන් ලෙස සැලකිය හැකි **එංගලන්තයේ ජෝන් වයික්ලිෆ්, බොහිමියාවේ යාන් හුස්**[22] සහ පුනරුද යුගයේ සිටි දූෂිත පාප්වරයෙකු වූ 6වන ඇලෙක්සැන්ඩර්[23]

විසින් පුළුස්සා මරා දැමූ දොමිනිකානු ධර්මදේශක ගිරොලාමෝ සැවොනරෝලා[24]යන ප්‍රතිසංස්කරණවාදීන්ය.

**මානවීයවාදීන්ගේ අභියෝගය**

පුනරුදයේ මානවීයවාදීන් වූ (Humanists) ලොරෙන්සෝවල්ලා (Lorenzo Valla, 1407-1457), ඩෙසිඩෙරියුස් ඉරැස්මස් (Desiderius Erasmus, 1466-1536) යන විද්වත්හු ශුද්ධ ලියැවිල්ලේ මුල් පිටපත් ඒවා ලියැවුණු මුල් භාෂාවලින් අධ්‍යයනය කොට, පැවති ශාස්ත්‍රීයවාදී දේවධර්මය (Scholastic Theology) බයිබලීය අධ්‍යයනය මගින් අභියෝගයට ලක් කළහ. තවද මානවීයවාදීහු මධ්‍යකාලීන පාප්වරයේ දූෂිත බවද හෙළි කළහ. නිදසුනක් ලෙස මධ්‍යකාලීන යුගයේ පාප්වරු ඉතාලි භූමියට අයිතිය කියා පාමින් ලෞකික බලය වෙනුවෙන් පෙනී සිටියේ හතරවන ශතවර්ෂයේදී රෝම රදගුරු 1වන සිල්වෙස්ටර් පාප්තුමාට (314-335), කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයා විසින් කළ පරිත්‍යාගයක් පිළිබඳ ලියවිල්ලක් නිත්‍යානුකූල අයිතියක් ලෙස ප්‍රකාශ කරමින්ය. ලොරෙන්සෝවල්ලා මෙම ලේඛනය ව්‍යාජ ලියවිල්ලක් බව සනාථ කළේය. එහි අඩංගු ලතින් භාෂාව හතරවන සියවසේ පැවති භාෂා ශෛලිය නොවන බවත් එය 8වන සියවසේ සිටි පාප්වරු වංචනික ලෙස සකස් කළ ව්‍යාජ ලියවිල්ලක් බවත් විද්වත් අධ්‍යයනයකින් ඔහු පෙන්වා දුන්නේය.[25]

**මාටින් ලූතර් හා ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණය**

වෙනත් සභාවක් පිහිටු වීම ලූතර්ගේ අරමුණ නො වීය. ඔහුට සැබවින්ම අවශ්‍යය වූයේ සභාවේ පැවති දූෂිත තත්ත්වයන් පිළිබඳව බුද්ධිමය සංවාදයක් මගින් පාප්තුමා දැනුවත් කොට ප්‍රතිසංස්කරණයක් දියත් කිරීමය. අදණ්ඩනවර (Indulgences) වෙළඳමේදී ශුද්ධවූ දේ දූෂණය කිරිමට විරුද්ධව ටෙට්සෙල් හා ඔහුගේ පිරිසට විරුද්ධව කටයුතු කරන මෙන් රදගුරුවරුන්ගෙන් ලිපි මගින් ලූතර් ඉල්ලීම් කළද එය අසාර්ථක විය. 1517 දී අදණ්ඩනවරය විකිණීම විවේචනය කරමින් විටන්බර්ග් නුවර සියලු සාන්තුවරයන්ගේ දේවස්ථානයේ දොරටුවේ නියාමක හෙවත් ප්‍රඥප්ති 95 (95 Theses) පිළිබඳ ලතින් භාෂාවෙන් ලියූ පත්‍රිකාව මගින් ඔහු ආරාධනා කළේ විශ්වවිද්‍යාලය තුළ බුද්ධිමය සංවාදයකටය. එහි පිටපත් ඔහු රදගුරුවරුන්ට මෙන්ම ඇල්බ්‍රෙච්ට් රදගුරුවරයාටද යැවීය. ඇල්බ්‍රෙච්ට් මෙය පාප්තුමාට

දැනුම් දුන් පසු ලූතර්ව රෝමයට කැඳවනු ලැබීය. රෝමයට ගිය ලූතර්ට සභාවේ දූෂිත තත්ත්වය වඩාත් තහවුරු විය. සැක්සනීයේ පාලක ෆ්‍රෙඩෙරික් රජුගේ මැදිහත්වීම හේතු කොට ගෙන පාප්තුමා මෙම ප්‍රශ්නය විසඳීමට එතුමාගේ නියෝජිතයෙකු ලෙස අවුස්බර්ග්හි තෝමස් කැයෙතාන් (Thomas Cajetan, 1469-1534) කාදිනල්වරයාට භාර කළේය. දේවධර්මාචාර්යවරයෙක් වූ මෙම කාදිනල්තුමාට ලූතර් සමඟ බුද්ධිමය සංවාදයකට හැකියාව තිබුණ ද ඔහුගේ ඉල්ලීම වූයේ ලූතර් මනස්තාප විය යුතු බවයි. ලූතර් එය ප්‍රතික්ෂේප කළේය. අවසානයේදී ලූතර්ව 1521 දී සභාවෙන් නෙරපා හැරීම හෙවත් උත්ක්ෂේපනීය කර්මයට (Excommunication) ලක් කෙරිණ. ඉන් පසුව ද අවස්ථා කිහිපයක දී සභා ප්‍රතිසංස්කරණය ප්‍රශ්න විසඳා ගැනීමට ලූතර් සහ සභා නායකත්වය උත්සාහ කළ ද දොමිනිකානු සහ අගොස්තීනු නිකායන් අතර පැවති සභා දේශපාලනය ඊට හරස් විය. මේ හේතු කොට ගෙන වෙනත් ක්‍රිස්තියානි සභා ආරම්භ වීම ලූතරානු ප්‍රතිසංස්කරණයත් සමඟම සිදු විය. රෝම සභාවෙන් වෙන්ව ස්වාධීනව බිහිවන කිතුනු සභා හා ලූතරානු ප්‍රතිසංස්කරණයේ සාර්ථකත්වය ගැන ලූතර්ද පුදුම විය.[26]

**ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාව**

ප්‍රතිරෙපරමාදු ප්‍රගමනයක් වූ ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාවේ (1545-1563) මූලික අරමුණ වූයේ කතෝලික තර්කවේදීන් මගින් ලූතර්ගේ ඉගැන්වීම් හෙළා දැකීමය. මේ හේතු කොට ගෙන මෙම මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් වූයේ ධර්මනියාමක ආඥාවන්, විධි නියමයන් හෙවත් අභිශාපයන්, තද බල නීති රීති සහ තහනම් පොත් ලැයිස්තු යනාදියයි.[27]

**පළමු වතිකාන මන්ත්‍රණ සභාව**

පළමු වතිකාන මන්ත්‍රණ සභාවේ (1869-1870) මූලික අරමුණ වූයේ පාප්තුමාගේ නොවරදිනසුලු බව හෙවත් අවිරජ්ජනීය බව (Papal Infallibility) ධර්ම සිද්ධාන්තයක් ලෙස පිළිගැනීමට කටයුතු කිරීමයි.[28]

**දෙවන වතිකාන මන්ත්‍රණ සභාව (1962-65)**

පළමු නයිසීන මන්ත්‍රණ සභාවේ (325) සිට දෙවන වතිකාන මන්ත්‍රණ සභාව (1962-65) දක්වා පැවති ජගත් මන්ත්‍රණ සභා ගණන 21කි. ජගත් මන්ත්‍රණ සභා ඉතිහාසයේ දී දෙවන වතිකාන මන්ත්‍රණ සභාව සන්තතියක් ද නැතහොත් අසන්තතියක් ද (Is it Continuity or Discontinuity) යන්න මතභේදාත්මකය. කෙසේ වෙතත් අන් ජගත් මන්ත්‍රණ සභා සමඟ සසඳන කළ දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ අද්විතීය හා අසමසමබව මැනවින් අපට අවබෝධ වේ. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව එඬේරික මන්ත්‍රණ සභාවක් ලෙස (Pastoral Council) සභා නවෝදය වෙනුවෙන් පෙනී සිටියේ ධර්මනියාමක ආඥාවන්, විධිනියමයන් හෙවත් අභිශාපයන්, තද බල නීති රීති සහ තහනම් පොත් ලැයිස්තු යනාදියෙන් තොරවය. මුල් සභාවේ මෙන් ශුද්ධ වූ සංඝය නැවතත් දේව ජනතාව ලෙස නිර්වචනය කිරීමෙන් මධ්‍යකාලීන සභාවේ ඉස්මතු වූ ධූරාවලිය හෙවත් පිරමීඩකරණය ද ප්‍රතික්ෂේප විය.[29]

තව ද දේව ජනතාවගේ බහුතරය වන ගිහි ජනතාවට සභාව තුළ මූලිකත්වය ලබා දෙන්නට දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ක්‍රියා කළේ පළමු වතිකාන මන්ත්‍රණ සභාවේ පූජකවාදය[30] ප්‍රතික්ෂේප කරන ගිහි දේවධර්මයකට මඟ පාදමින්ය. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව තුළ ගිහි දේවධර්මයකට මඟ හෙළි කළ ඊව්ස් කොන්ගර් (*Yves Congar*) නම් වූ දේවධර්මාචාර්යවරයා පැවසුවේ "සංඝය විශ්වාසිකයන්ගෙන් සමන්විත වූවක් සේ නොසිතන විට සිදුවන්නේ කුමක් ද? එය මූලිකවම දෙවියන් හා ජනතාව අතර මැදිහත්කරුවකුගේ ආයතනික ස්වරූපයක් ගනී. එවිට සංඝයේ දූත මෙහෙවර හා මව් පදවිය හුදු බාහිර අණ පණත්වලට සීමාවී කිතුනු සංඝයේ පැවැත්ම පදනම් වන ප්‍රේම පාරමිතාව හා සාංඝික යැදුම වියැකී යන" බවයි.[31]

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ බයිබලීය මූලාශ්‍රය ඉගැන්වීම්වලින් හා ප්‍රාණයාණන්ගේ මඟ පෙන්වීමෙන් විශ්වීය කතෝලික සභාව තුළ ජනිත කළ එම උන්මූල (radical change) වෙනසට, දේශීය වශයෙන් ගත් කළ හදවතින් හා මනසින් විවෘත වූ අතළොස්සක් අතරට **ලියෝ නානායක්කාර රදගුරුතුමා, මයිකල් රුද්‍රිගෝ, තිස්ස බාලසූරිය සහ ඇලෝයිසියස් පීරිස් යන පියතුමන්ලා**

අයත් වෙති. මෙම පූජකවරුන්ගේ මඟ පෙන්වීමෙන් ලාංකේය කිතුනු සභාවේ නවෝදය උදෙසා කැප වුණු ප්‍රගතිශීලි ප්‍රජා කණ්ඩායම්, මිනිසා වෙන් කරන ආගම් හා ජාති භේද අතික්‍රමණය කරමින් මිහිමත දේව රාජ්‍යයේ උදාව වෙනුවෙන් සමාජ දේශපාලනික මෙහෙවරක යෙදෙන්නේ ජේසු සමිඳුන්ගේ ප්‍රාණය විසින් අධිරාජ්‍යයෙන් පිටතට ශුද්ධ වූ සංඝය කැඳවන සැබෑ එක්ලේසියාවක් වන්නටය.

**පාදක සටහන්:**

1 හිලේරියන් දිසානායක, *කිතුනු සංඝය සුදතුම් පොදු හවුල*, (කොළඹ: සමාජය හා සාමයික කේන්ද්‍රය, 2007),18-19.

2 එම, 19-20.

3 See Norman Tanner, *New Short History of the Catholic Church*,(London: Burns & Oates, 2011), xv; See also Aloysius Pieris, *Providential Timeliness of Vatican II*, (Kelaniya: Tulana Research Centre, 2013), 10.

4 Aloysius K. Ziegler, “Pope Gelasius and His Teaching on the Relation of the Church and State," *Catholic Historical Review*, 27, 4 (1942): 430.

5 See Aloysius Pieris, *Give Vatican II a Chance*, (Kelaniya: Tulana, 2010), 100-101; “Let the Pope, once more become the *Vicarius Petri et Pauli*, in accordance with ancient tradition. Let him, we plead, renounce the title, *Vicarius Christi*, and give it back to whom it belongs by Christ's own design: *the poor*, (the hungry and the thirsty, the naked and the sick, the homeless and the imprisoned) from whom it was stolen by Christian Emperors. Let him give an example also to the bishops who have usurped that title since Vatican II (LG, 27)!"

6 See ibid., 104; “[…] the pope is certainly the successor of his predecessor in the office but *not* the “successor" of Peter and Paul; he is their *vicar* or their *vicem gerens*, their *locumtenens*! The word *Apostle*, as applied to The Twelve, does not allow sucession." See also J.M.R. Tillard, *The Bishop of Rome*, (London: SPCK, 1983), 104.

7 Austin Flannery (General Editor), *Vatican Council II*: *The Conciliar and Post Conciliar Documents*, (Bombay: St. Paul Publications, 1975, 323-324.

8 බලන්න දිසානායක, *කිතුනු සංඝය සුදතුම් පොදු හවුල*, 21.

9 බලන්න එම, 22

10 Nihal Abeyasingha, *History of Christianity*: *A Graduate Study Guide*, (Colombo: Asian Institute of Missiology, 2011) 212; “Perhaps the best portrayal of the pre-Constantine lay person's situation among the non-Christians is in the Letter to Diognetus (c. 125) […] They live in their native lands, but like foreigners. They take part in everything like citizens, and endure everything like aliens. Every foreign country is their native land, and every native land a foreign country."

11 දිසානායක, *කිතුනු සංඝය සුදනුම් පොදු හවුල*, 36.

12 See Tanner, *New Short History of the Catholic Church*, 27; “In the following year Constantine reached an agreement with his co-emperor Licinus on a policy of religious freedom which was enshrined in the so-called Edict of Milan. He subsequently fell out with Licinus, who resorted to spasmodic persecutions of Christians, and it was only in 324 that Constantine won a decisive battle at Chrysopolis which left him as sole emperor."

13 See Tanner,*New Short History of the Catholic Church*, 27; “This code of law, […] raised Christianity from the status of favoured religion to that of the only permitted religion. Paganism was banned and heresy penalized."

14 See William J. La Due, *The Chair of Saint Peter*:*A History of the Papacy*, (New York: Orbis, 1999), 45; “The gifts and the privileges which Constantine showered on the Church, and specially the Church in Rome, are legendary. He gave to the pope the magnificent Lateran Palace as his residence and financed the construction of numerous churches and basilicas in Rome and elsewhere."

15 See William A, Jurgens, *The Faith of the Early Fathers*, Vol. I, (Bangalore: Theological Publications, 1992); 90, “*Adversus haereses* (Against Heresies) 3:3:2. […] by pointing out here the succession of the bishops of the greatest and most ancient Church known to all, founded and organized at Rome by the two most glorious Apostles, Peter and Paul […]. For with this Church, because of its superior origin, all Churches must agree, that is, all the faithful in the whole world; and it is in her that the faithful everywhere have maintained the Apostolic tradition."

16 See La Due, *The Chair of Saint Peter*: *A History of the Papacy*, 95; “[…] the worsening relations with the Byzantines bring us to a very painful incident which colored the history between Christian East and West for nearly 1,000 years. The encounter took place in July 1054 between one of Leo's chosen cohorts, Cardinal Humbert of Silva Candida, and the patriarch of Constantinople, Michael Cerularius."

17 See Tanner, *New Short History of the Catholic Church*, 158; "Relations with the Orthodox church were severely stretched in 1204 when western crusades sacked Constantinople, following their attempt to restore a pro-western emperor."

18 See Ibid., 159. Also see Nihal Abeyasinghe, *An Undergraduate Study Guide* (Colombo: Asian Institute of Missiology, 2011), 226; "The crusades were a tragic episode of bloodshed in the name of God, motivated, as we have seen by a mixture of motives – intolerance, political ambition, motives of devotion etc. It was a sacrifice of human life out of all proportion to the ends which were sought. Unfortunately, the crusades, especially the behavior in Jerusalem (second crusade) hardened the bitter feelings between east and west."

19 See La Due, *The Chair of Saint Peter*: *A History of the Papacy*, 324; "An ecclesiastical tribunal for searching out and punishing heretics. The Inquisition began in the twelfth century, and after 1232 was specially identified with the Dominican friars. The techniques that were employed bordered in many cases on flagrant injustice and unbridled cruelty. In 1542, Paul III established the Holy Office as the final court of appeal in all heresy trial."See also Tanner, *New Short History of the Catholic Church,* 155-156; "The use of torture by the Inquisition, to extract information and confession, was authorized by pope Innocent IV in 1252, albeit with restrictions."

20 See Tanner, *New Short History of the Catholic Church,* 150-151. See also Pieris, *Providential Timeliness of Vatican II,*39-40.

21 See Tanner, *New Short History of the Catholic Church,* 156; "[…] – indeed the Inquisition protected many individuals from false accusations, especially women accusedof witchcraft – nevertheless corporate punishment was frequent and many people were put to death." See also Pieris, *Providential Timeliness of Vatican II,*39; "The torture and elimination of women accused of 'witch craft' was an extension of the inquisition. So called witches or sorceresses were sometimes made to sit on burning coal so that, once their genitalia were scorched, they would not be able to intercourse with the devil […]. බලන්න මාරියා මිස්, "යටත්විජිතකරණය හා ගෘහනීකරණය" ***ඉතිහාස***, පළමු කලාපය, 2008, 91; "1631 දී ෆෙඩ්රික් වොන් විසින් ස්ත්‍රී හිංසනය හා මායාකාරියන් දඩයමට එරෙහිව නිර්නාමික රචනයක් ලිවීමට එඩිතර විය. හිංසනයේ පරපීඩා හා කාමුක ලක්ෂණ හෙළිදරව් කරන හේ පාලකයන්, පල්ලිය හා ආගමික ආයතන මායාකාරී හිස්ටිරියාව තුළ සියලු ප්‍රශ්නවලට, කැළඹීලිවලට හා දුගී ජනයා අතර

අසහනයට ව්‍යාජ හේතුවක් මවා පා තමන් වෙත ඒමට ඉඩ ඇති ජනතා විරෝධය මෙම දුප්පත් ගැහැනුන් වෙත යොමු කරන ලද බව පවසයි."

22 See Tanner, *New Short History of the Catholic Church*, 151-153.

23 See Ibid., 118; "[…] Alexander VI (1492-1503), is the most notorious of the Renaissance popes, indeed perhaps of all popes. He kept a string of mistresses and fathered through them at least ten illegitimate children […]."

24 See Ibid., 118; "Pope Alexander VI celebrated the Jubilee year of 1500 in style and by granting many indulgences. His quarrels with Giralamo Savanarola, the famous Dominican preacher, ended tragically with Savanarola's condemnation and execution by burning at stake in Florence."

25 See B. Coleman, *The Treatise of Lorenzo Valla on the Donation of Constantine* (CT: New Haven, 1922).

26 SeeAbeyasingha, *History of Christianity*: *A Graduate Study Guide*, 246-250.

27 Norman P. Tanner, *The Councils of the Church: A Short History*, (New York: The Crossroad Publishing Company, 2001) 77-87.

28 Tanner, *The Councils of the Church: A Short History*, 91; "The primacy of the pope included an "infallible teaching authority," the decree stated."

29 SeePieris, *Give Vatican II a Chance*, 165; "Vatican II is the first Council in history to define the church non-hierarchical as the "People of God", treating the bishops and presbyters as ministers in the church so defined (LG, 9-7)."

30 බලන්න දිසානායක, ***කිතුනු සංඝය සුදතුම් පොදු හවුල***, 97-98; "සංඝයේ පූර්ණ බලය රැඳී ඇත්තේ පාලක පෙළේ පිරිස මතය. ක්‍රිස්තුන් වහන්සේගේ සංඝය එක සමාන අයිතිවාසිකම් ඇති එක හා සමාන විශ්වාසිකයන්ගේ හවුලක් නො වේ. එය අසමාන අයගෙන් සැදුණු සමාජයකි."

31 Y. Congar, *Lay People in the Church: A Study for a Theology of Laity* (New York 1985).